උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ක්‍රිස්තු ධර්මය - II | කාලය පැය දෙකයි |
|---|---|---|

- පළමු ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

(01). කෙටි පිළිතුරු ලියන්න.

(1). දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝ ය ..................................... සම්පූර්ණ කරන්න.
(2). "පරිසි" යන නමේ තේරුම කුමක් ද? ඔවුන් ක්‍රියා කළේ කෙසේ ද ?
(3). "ප්‍රේරිත" යන්නෙහි අර්ථය කුමක් ද?
(4). ජේසුස් වහන්සේගේ උපත දිළිඳු පරිසරයක සිදු වූ බවට සාක්ෂි 02 ක් ලියන්න.
(5). උත්ථානයේ ආශ්චර්ය නිසා වියවුල්ව සිටි ශ්‍රාවක හා අනුගාමික පිරිසට ලැබුණු බලාපොරොත්තුවේ සහතිකය කුමක් ද?
(6). දේව රාජ්‍යයේ ලකුණු හෙවත් ප්‍රාතිහාර්ය කාණ්ඩ හතරකට වර්ග කළ හැකිය. ඉන් 02 ක් ලියන්න.
(7). "ඉසිලිය නොහැකි බර මිනිසුන් පිට පටවන්නා හුය" කියමින් ජේසුස් වහන්සේ වෙත චෝදනා එල්ල කළේ කාහට ද? වර්තමාන සමාජයේ එලෙස ජනතාව මත බර පටවන කණ්ඩායමක් නම් කරන්න.
(8). "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා." මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න.
(9). මෙසියස්තුමාණන්ගේ සාම රාජ්‍යයේ මූලික පදනම් 02 ලියන්න.
(10). එල දරන හා එල නොදරන මිදි වැලෙහි අතු සම්බන්ධයෙන් එම උපමාව අනාවරණය කරන කරුණු 02 ලියන්න.

(2 × 10 = 20)

(02). (i). දිවැසිවරයා යනු කවුරුන් ද?
දිවැසිවර කාර්ය කුමක් ද? (ල. 2)

(ii). රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ 03 පෙළගස්වන්න. (ල. 3)

(iii). ජේසුස් වහන්සේ තම ජීවිතයේ දී එඬේරික කාර්ය නිසියාකාරයෙන් ක්‍රියාත්මක කළ ආකාරය හා වර්තමානයේ අප එඬේරවරුන් ලෙස සමාජයේ ක්‍රියා කරන ආකාරය සංසන්දනාත්මකව පැහැදිලි කරන්න. (ල. 5)

(03). (i). ආබ්‍රහම්ගේ ජීවිතයේ ක්‍රියාකාරීත්වය තුළ අවධාරණය කරනු ලබන වැදගත් කරුණු 02 පෙළගස්වන්න. (ල. 2)

(ii). ආබ්‍රහම්තුමාට ලැබුණ වූ ත්‍රිවිධාකාර පොරොන්දු ලියා දක්වන්න. (ල. 3)

(iii). වර්තමාන සමාජයට දසපනතේ වැදගත්කම පහදමින් ලිපියක් ලියන්න. (ල. 5)

(04). (i). මෙහි අවස්ථා සම්බන්ධය ලියන්න.
"පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න" (ල. 2)

(ii). තමා කවුරුන්දැයි ජේසුස්වහන්සේ ශ්‍රාවක කණ්ඩායමෙන් විමසූ විට පේදුරුගේ ප්‍රකාශය වූයේ කුමක් ද? (ල. 3)

(iii). ස්නාවක ජොහාන්තුමා අනුශාසනා කරනු ලබන සමාජ කණ්ඩායම් තුනට ප්‍රකාශ කළ දේවල් මොනවා ද? අද සමාජයට ඒවා කොතෙක් දුරට සම්බන්ධ කළ හැකි ද යන්න සංසන්දනාත්මකව විස්තර කරන්න. (ල. 5)

www.edudept.up.gov.lk

(05). (i). "ඇගෙන් අහක්ව යන්නට ජේසුස් වහන්සේගේ නාමයෙන් නුඹට අණ කරමි." මෙහි අවස්ථා සම්බන්ධය කුමක් ද? (ල. 2)

(ii). ලිදියා නම් කාන්තාවගේ ජීවිත පරිවර්තනය හා ඇය පිළිගැන් වූ ආගන්තුක සත්කාරය සඳහන් කරන්න. (ල. 3)

(iii). යොවුන් වියට පා තබන කිතුබ ඔබට දේව දීමනා වැය කරමින් යම් සේවාවක් ඉටු කිරීමට ප්‍රස්තාවක් විවෘත වුවහොත් ඔබ එම කාර්ය භාරය වෙනුවෙන් කැපවන ආකාරය පාවුල්ගේ ජීවිත ආදර්ශයෙන් ගෙන හැර දක්වන්න. (ල. 5)

(06). (i). දේව රාජ්‍ය වර්ධනය පිළිබඳ පැවසූ උපමා 02 නම් කරන්න. (ල. 2)

(ii). ඉන් එක් උපමාවක් ලියා දක්වන්න. (ල. 3)

(iii). ඔබ "අන්ධකාර පාපිෂ්ඨ ලෝකයේ දිලෙන තාරකාවක් " වීමට ගත යුතු පියවර 05 ලියන්න. (ල. 5)

(07). පහත මාතෘකා අතුරින් 02 කට ගෙන කෙටි සටහන් ලියන්න.
(i). පාවුලුතුමාගේ නායකත්ව ගුණාංග
(ii). ජුදා සමාජයේ කොන් වූ ජන කණ්ඩායම්
(iii). පරිසිවරු හා අයකැමියන් (2 × 5 = 10)

www.edudept.up.gov.lk